**සීමා සහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව - 2020**

**-----------------------------------------------------**

**1.1** මතය

**------**

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ (“බැංකුව”) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

**------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛන්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

<table>
<tr><th></th><th>විගණන ගැටළුව</th><th>කළමනාකරණයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(i)</td><td>භෞතික සත්‍යාපනයට අනුව ලිපිද්‍රව්‍ය තොගයේ අගයත් වසර අවසානයේ මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබූ අගයත් අතර වෙනසක් පැවතුණි.
<table>
<tr><th>අයිතමය</th><th>මූල්‍ය ප්‍රකාශන වලට අනුව</th><th>භෞතික සත්‍යාපන වාර්තාවට අනුව</th><th>වෙනස</th></tr>
<tr><td></td><td>(රු.)</td><td>(රු.)</td><td>(රු.)</td></tr>
<tr><td>තොගය</td><td>1,349,941</td><td>1,462,352</td><td>112,411</td></tr>
</table>
</td><td>එකඟ වන ලදී. ලිපිද්‍රව්‍ය තොගවල භෞතික සත්‍යාපනය අදාළදෙපාර්තමේන්තුව සමඟ සිදු කෙරෙන අතර වහාම දෝෂ නිවැරදි කරනු ලැබේ.</td><td>තොග පවත්වා ගැනීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය සතුටුදායක ලෙස සිදු කළ යුතුය.</td></tr>
<tr><td>(ii)</td><td>පහත සඳහන් ණය කාණ්ඩවල මූල්‍ය ප්‍රකාශන වලට අනුව ශේෂයන් සහ පරිගණක පද්ධතියේ ශේෂයන් අතර වෙනසක් පැවතුණි.
<table>
<tr><th>ණය කාණ්ඩය</th><th>මූල්‍ය ප්‍රකාශන වලට අනුව ශේෂය</th><th>පරිගණක පද්ධතිය අනුව ශේෂය</th><th>වෙනස</th></tr>
<tr><td></td><td>(රු.)</td><td>(රු.)</td><td>(රු.)</td></tr>
<tr><td>කුලී පිට ගැණුම්</td><td>109,184,202</td><td>109,154,922</td><td>29,280</td></tr>
<tr><td>කල්බදු</td><td>412,380,393</td><td>412,265,495</td><td>114,898</td></tr>
<tr><td>උකස්</td><td>38,606,533</td><td>39,105,049</td><td>(498,515)</td></tr>
</table>
</td><td>පද්ධතියේ දෝෂයක් හේතුවෙන්,අවසන් කිරීමේ සටහන ලැබිය යුතු කුලීපිට ගැණුම් ගිණුමට නිවැරදිව සටහන් කර නොතිබුණි.මෙම දෝෂය 2021 වර්ෂයේදී හඳුනාගෙන නිවැරදි කරන ලදී. තවද පද්ධතියේ දෝෂයක් හේතුවෙන්,ලැබීම් සටහනක් ලැබිය යුතු කල්බදු කුලීගිණුමට නිවැරදිව සටහන් කර නොතිබුණි.නමුත් මෙය යෙදුම් මට්ටමින් නිවැරදිව සකසා ඇත.මෙම වෙනස 2021 වර්ෂයේදී හඳුනාගෙන නිවැරදි කරන ලදී.</td><td>පරිගණක පද්ධතිය සහ පොදු ලෙජරය අතර සැසඳුම බැංකුව විසින් වරින් වර සිදු කළ යුතුය.</td></tr>
</table>

### 1.5.2 අවිනිශ්චිත ගිණුම්

<table>
<tr><th>විගණන ගැටළුව</th><th>කළමනාකරණයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(i) PSDB ගණුදෙනුකරුවන්ගේ (ආන්තික) ගෙවිය යුතු තැන්පතු ගිණුමට රු.258,700ක හඳුනා නොගත් ශේෂයක් ඇතුළත් කර තිබුණි.</td><td>සටහන් කර ගන්නා ලදී.</td><td>ශේෂයන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.</td></tr>
<tr><td>(ii) පහත සඳහන් හඳුනා නොගත් ශේෂයන් පියවීමකින් තොරව වෙනත් වගකීම් යටතේ ඇතුළත් කර තිබුණි.<br>
<table>
<tr><th></th><th>අගය<br>(රු.)</th></tr>
<tr><td>හඳුනානොගත් තැන්පතු</td><td>308,150</td></tr>
<tr><td>අවිනිශ්චිත ගණුදෙනුකරුවන්</td><td>189,955</td></tr>
<tr><td>අවිනිශ්චිතගිණුම් නිෂ්කාශනය</td><td>581,290</td></tr>
<tr><td>අවිනිශ්චිත ණයහිමි ගිණුම</td><td>34,341</td></tr>
<tr><td>අවිනිශ්චිත සංක්‍රමණ ණයහිමි ගිණුම</td><td>5,575</td></tr>
<tr><td>අවිනිශ්චිත ගිණුම හඳුනානොගත් බැංකු තැන්පතු</td><td>4,657,371</td></tr>
<tr><td>අත්තිකාරම් එකතු කිරීම- ක්ෂුද්‍ර මූල්‍ය</td><td>9,039,400</td></tr>
</table></td><td>මෙම ශේෂයන් දිගු කාලයක් පුරා නොවෙනස්ව පවතී. අවිනිශ්චිතගිණුමේ හඳුනානොගත් බැංකු තැන්පතු වල රු.4,657,371 ක අගය හඳුනානොගත් ගණුදෙනුකරුවන්ගේ සෘජු බැංකු තැන්පතු වේ. රු.9,039,400ක අත්තිකාරම් එකතුකිරීම- ක්ෂුද්‍ර මූල්‍ය යනු හවුල්කාර සංවිධානයක් විසින් කරන ලද අත්තිකාරම් ගෙවීමකි.2021 සැප්තැම්බර් 30 දිනට ශේෂය රු.3,210,339 කි.</td><td>ශේෂයන්හඳුනාගැනීමේක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.</td></tr>
<tr><td>(iii) පහත සඳහන් ණය සහ අත්තිකාරම් පද්ධතිය තුළ අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කර ඇත.කෙසේ වෙතත් කළමනාකාරීත්වයේ පැහැදිලි කිරීම අනුව එම ණය පියවා ස්වයංක්‍රීය නොවන පරිදි (manually) වසා දමා තිබුණි.පියවීම් සම්බන්ධයෙන් කිසිඳු සාක්ෂියක් නොතිබුණි.<br>
<table>
<tr><th>ගිවිසුම් අංකය.</th><th>ණය වර්ගය</th><th>ප්‍රාග්ධන වටිනාකම.<br>(රු.)</th><th>පොළී වටිනාකම<br>( රු.)</th><th>එකතුව<br>(රු.)</th></tr>
<tr><td>HOFPL130000029</td><td>පුද්ගලික</td><td>250,000</td><td>19,345</td><td>269,345</td></tr>
<tr><td>HEDLE13000288</td><td>කල්බදු</td><td>220,000</td><td>83,082</td><td>303,082</td></tr>
<tr><td>HEDLE120000148</td><td>කල්බදු</td><td>210,000</td><td>79,305</td><td>289,305</td></tr>
</table></td><td>මෙම පහසුකම් භෞතිකව ලබා නොදුන් අතර නව පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂණයක් ලෙස ක්‍රියාත්මක විය. එය පරීක්ෂණ අරමුණු සඳහා පමණක් නිර්මාණය කර ඇති බැවින් මෙය පද්ධති සපයන්නා විසින් ස්වයංක්‍රීය නොවන ආකාරයට වසා දමා ඇත.</td><td>මේ ආකාරයේ ශේෂයන් සජීවී පද්ධතියට ඇතුළත් නොකළ යුතුය.</td></tr>
</table>

**1.5.3** අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තුකිරීම

-----------------------------------------

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** මූල්‍ය ප්‍රකාශන වලට අනුව, පහත සඳහන් වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පැවතුණි.මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. | සඳහන් කර ඇති සමහර වත්කම් PSDB(ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ) සහ NDTF වෙත පැවරීමේ දී මාරු කළ සහ දිගු කාලීනව පවතින ඒවාය. මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර ඇත්තේ රක්ෂණ අරමුණු සඳහා පමණක් වන අතරඑය මූල්‍ය ප්‍රකාශනවලගැලපුම් කර නොතිබුණි.අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණය බැංකුවට වියදමක් වන බැවින් එය සිදු කර නොමැත.ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මෙය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.අපහරණය කරන අවස්ථාවේදී, අයිතම අපහරණය කිරීම සඳහා යෝග්‍ය ප්‍රත්‍යාගණනය කිරීමේක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිත අංක 16 හි 34 වන ඡේදයට අනුව,වසර 3 සිට 5 දක්වා කාලය තුළ වත්කම් නැවත තක්සේරු කිරීම අවශ්‍ය වේ. |

| වත්කම | ඒකක ගණන | පොත් අගය (රු.) |
|---|---:|---:|
| මෝටර්රථ වාහන | 19 | 44,241,186 |
| පරිගණක උපකරණ | 207 | 37,504,012 |
| දුරකථන උපකරණ | 53 | 697,318 |
| ලී බඩු හා සවිකිරීම් | 212 | 12,514,634 |
| නැවත සකස්කිරීම් | 111 | 6,495,253 |
| කාර්යාල උපකරණ | 144 | 11,489,463 |
| අනෙකුත් වත්කම් | 158 | 11,990,985 |

**1.5.4** සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක **02/19/319/0001/004** දරන **2021** ජනවාරි **05** දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ, ලිපියට අනුව**2021**සැප්තැම්බර් **30** වන දින වන විට බැංකුව ඇවර කිරීමට හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව(**NSB**) සමඟ ඒකාබද්ධ කිරීමටනියමිත වී තිබුණිකෙසේ වෙතත්,<br>i. **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩ පැවැත්ම මාතෘකාව යටතේ කිසිඳු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.<br>ii. තවද කළමනාකරණ නියෝජනයට අනුව, "අඛණ්ඩව පවත්වාගෙන යාමට මණ්ඩලයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැක ඇති වන සිද්ධීන් හෝ තත්ත්ව සම්බන්ධව ප්‍රමාණාත්මකඅවිනිශ්චිතතා නොපැවතුණි."යන්න සඳහන් කර තිබුණි. | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (**SLSB**) සම්පූර්ණයෙන්ම ජාතික ඉතිරි කිරීමේ බැංකුව (**NSB**) සමඟ ඒකාබද්ධ කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බව **2021** ජනවාරි **05** දිනැති, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ ලිපියෙන් දන්වා ඇත.<br>ඒ අනුව,**SLSB**වෙත නව ණය ලබා දීම,නව තැන්පතු භාර ගැනීම,නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ කිසිඳු පාර්ශවයක් සමඟ නව ගිවිසුම් වලට එළඹීමෙන් වළකින ලෙස මුදල් මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කර ඇත.මෙම ප්‍රතිපත්තිමය තීරණය ශේෂ පත්‍ර දිනයෙන් පසුව ගෙන ඇත.<br>උදා: **2020** දෙසැම්බර් **31**වන දින නමුත් මෙම සිදුවීම වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු සිදු වීම් යටතේ සටහන අංක **39** වාර්තා කර ඇත.<br>ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (**SLSB**) ජාතික ඉතිරි කිරීමේ බැංකුව(**NSB**) සමඟ සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කිරීමට කටයුතු කරන බව **SLSB**හි මව් ආයතනය වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව මහ බැංකුවට දන්වා ඇත. එමෙන්ම, ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු**SLSB**හට සිය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට අවසර දෙන ලෙස ජාතික ඉතිරි කිරීමේ බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. | ශේෂ පත්‍ර දිනයෙන් පසු කිසියම් සිද්ධියක් ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්මට බලපාන්නේ නම්,බැංකුව විසින් අඛණ්ඩ පැවැත්මේප්‍රතිපත්තිය යටතේ හෙළිදරව් කළ යුතුය.ඊට අමතරව,කළමනාකරණ නියෝජනය තුළ ඉහත කී නොපවත්වා ගැනීමේ අවදානම පිළිබඳව කළමනාකාරීත්වය දැනුම් දිය යුතුය. |

**1.5.5** විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **PSDB**වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් ගෙවන ලද වට්ටම් සහ තැන්පතු අරමුදල පිළිවෙලින් රු.**13,376,694** ක් සහ රු.**7,098,200** ක් සම්පූර්ණයෙන් හානිකරණය වී තිබුණි.කෙසේ වෙතත්, එම ශේෂයන් තහවුරු කිරීමට කිසිඳු සාක්ෂියක් නොතිබුණි. | **PSDB** සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනා නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර එහි සම්පූර්ණ නඩු වටිනාකම රු.**7,098,200** කි.ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන කරුණු වල නඩු අංක පහත පරිදි වේ.<br>• **SC/HC/LA/01/2017**<br>• **SC/HC/LA/02/2017** | ශේෂ පත්‍රයේ සෑම ශේෂයක් සඳහාම සාක්ෂි සහ විස්තර පවත්වා ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) පෙර වසර වල සිට පැවත එන රු.48,498 ක මුදල් ඌණතාවය ඒ සඳහා වගකිවයුතු කාර්ය මණ්ඩලයෙන් අයකර ගැනීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | එකඟ වූ අතර එය 2021 දී නිවැරදි කරනු ලැබේ. | මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රම වේදයක් ස්ථාපිත කළ යුතුය. |
| (ii) වසර කිහිපයක සිට අය නොවී පවතින රු.2,866,959 ක ලැබිය යුතු ශේෂ එකතුවේරු.1,999,000 ක ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයක් ඇතුළත් වී තිබුණි. | එකඟ වූ අතර එය2021 දී නිවැරදි කරනු ලැබේ. PSDBඉඩමSLSBවෙත පැවරීමේ දී ලැබිය යුතු රු. 1,999,000ක මුද්දරගාස්තුවගෙවා ඇත.ඉහත විකිණීමෙන් මෙය නැවත ලබා ගත හැකිය.අනෙකුත් අයිතමඅවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ගේ උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ඇත. | හිඟ ශේෂ පියවීමට පියවර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) පහත සඳහන් වෙනත් වගකීම් ශේෂයන් නිරවුල් කිරීමකින් තොරව වසරකට වැඩි කාලයක් හිඟව පැවතුණි.<br><br>රු. ---<br>ගෙවිය යුතු බදු–දඩ 196,424,540<br>දෝෂ නිවැරදි කිරීමේ ඉතුරුම් 1,975,871<br>ලැබිය යුතු–කාර්ය මණ්ඩල 268,358<br>ලැබිය යුතු – පුද්ගල ණය CRIBගාස්තු 32,650<br>ප්‍රාග්ධන කල්පිරීමේ අවිනිශ්චිත ගිණුම–ස්ථාවර තැන්පතු( FD) 267,853<br>ණය සුරැකුම් අරමුදල-ප්‍රජා දිරිය 67,350 | ගෙවිය යුතු බදු -දඩ- රු.196,424,540.00කින්, රු.24,536,137.29 ක දඩ මුදලක්2021 සැප්තැම්බර් 30 දින වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දැනටමත් කපා හැර ඇත.2021දෙසැම්බර් මස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අවසන් ගෙවීමේ සැලැස්මට අනුව මූල්‍ය සේවා (FS)මතඑකතු කළ අගය මත බද්ද (VAT) සහ මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්දට (NBT)අදාළරු.78,028,303 හි දඩ මුදල කපා හැරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වරයා එකඟ වන ලදී. | හිඟ ශේෂයන් සාධාරණ කාල සීමාවක් තුළ සැසඳුම් කර සහ නිරවුල් කිරීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ii)** **2020** දෙසැම්බර් **31**දිනට,ගෙවියයුතුආර්ථික සේවා ගාස්තු **(ESC)** ශේෂය රු. **310,520** ක් සහලැබිය යුතුආර්ථික සේවා ගාස්තු ශේෂය රු. **2,507** ක් මූල්‍ය ප්‍රකාශන වල පැවතුණි. | දේශීයආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ශේෂයන් **2021**වසරේදීනිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ශේෂයන් සාධාරණ කාලයක් තුළ නිවැරදි කළ යුතුය. |
| **(iii)** **2020** වසර අවසානයේ ගෙවිය යුතු මුදල් යටතේ වූ ඉතුරුම් ස්ථාවර නියෝග පාලන ගිණුමෙහි රු.**109,885** ක අසාමාන්‍ය ඍණ ශේෂයක් ඇතුළත් වී තිබුණි. | එකඟ වූ අතර එය **2021** දී නිවැරදි කරනු ලැබේ. | බැංකුව මෙම අසාමාන්‍ය ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| **(iv)** **2008** වර්ෂයේදී සේවකයින්ගේ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා අවකරණය කරන ලද රු.**1,765,404** ක මුදල ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වා ඇත.කෙසේ වෙතත්, එම සේවකයින් විශ්‍රාම ගිය පසුවත් එම මුදල් ගෙවීමට බැංකුව කටයුතු කර නොතිබුණි. | **2008** වර්ෂය තුළ කුමනසේවකයෙකුගෙන් කොපමණ මුදලක් අවකරණය කර තිබේද යන්න හඳුනා ගැනීමට නිසි මූලාශ්‍රයක් නොමැති බැවින් එම අවකරණය කරන ලද මුදල ස්ථිර සේවකයන්ගේ යෝජිත විශ්‍රාම වැටුප් අරමුදලට පැවරීමට තීරණය විය. | අනාගතයේ දී විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නිසි වාර්තා සහ ලේඛන තබා ගත යුතුය. |

**1.7** පොදු පාලනයන්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** බැංකුව විසින් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛා අඩවියේ උපස්ථ **(Backup)** පවත්වාගෙන ගොස් තිබුණි.එය දුර කිලෝ මීටර **3** කට වඩා අඩු වන අතර එය ප්‍රධාන පද්ධතියේ සිට උපස්ථ ස්ථානයට පිළිගත හැකි දුරක් නොවුණි. | සටහන් කර ගන්නා ලදී.මේ වන විට අප සතුව ආපදා ප්‍රතිසාධන **(Disaster Recovery)**අඩවියක් නොමැති බැවින්,මහ බැංකුවෙන් ව්‍යාපාර ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගෙන හැකි ඉක්මනින් **(ASAP)** එය ක්‍රියාත්මක කිරීමට අපි සැලසුම් කරන්නෙමු.තව දුරටත් අප විසින් ග්‍රෙගරි පාරේ පිහිටි අපගේම ගොඩනැගිල්ලක තාවකාලික ආපදා ප්‍රතිසාධන අඩවියක්ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇත.තවද අප විසින් මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ ආරක්ෂිත සේප්පුවේ දෛනිකව උපස්ථ තබා ගන්නෙමු. | උපස්ථ සාධාරණ දුරකින් ඔබ්බට පිහිටා තිබිය යුතුය. |
| **(ii)** බැංකුව සඳහා ආපදා ප්‍රතිසාධන **(Disaster Recovery)** අඩවියක්නොතිබුණි. | පිළිගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ද දැනුම් දී ඇත. ඒකාබද්ධ කිරීමේ තීරණය හේතුවෙන්,ග්‍රෙගරි පාරේ ගොඩනැගිල්ලේ තාවකාලික ආපදා ප්‍රතිසාධන අඩවියක් **(DR)** ඉදිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දී ඇති අතර එය ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇති අතර එය මේ වන විට ප්‍රසම්පාදන මට්ටමේ පවතී. | බැංකුව සතුව මූලික අඩියරේ දී ආපදා ප්‍රතිසාධනයක් **(DR)**තිබිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.275,056,231කලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 447,816,707 කි.එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.172,760,476 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට වෙළඳපොල පොලී අනුපාත සියයට 23 කින් පහත වැටීම හේතුවෙන් පොලී ආදායම අඩු වීම සහ 2019 වසරේදී රු.මිලියන 125.8 ක දඩ මුදල් කපා හැරීම නිසා අනෙකුත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) සියයට 40 කින් අඩු වීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්හි උපනති විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් පෙර වසර හා සසඳන විට වැඩි වීමේ හෝ අඩු වීමේ ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය පහත දක්වා ඇත.

| විස්තරය | විචලනය (රු.) | විචලනය % | වෙනසට හේතුව |
|---|---|---|---|
| පොලී ආදයම | ( 230,336,435) | (23) | වෙළඳපොල පොලී අනුපාත පහත වැටීම |
| පොලී වියදම | (19,493,659) | (21) | වෙළඳපොල පොලී අනුපාත පහත වැටීම |
| ගාස්තු හා කොමිස් ආදායම් | 2,473,262 | 149 | ණය සහ අත්තිකාරම් නිදහස් කිරීමේදී අයකරන ගාස්තු සහ ආදායම් වැඩි වීම. |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | (53,877,016) | (40) | 2019 වසරේදී රු. මිලියන 125.8 ක දඩ මුදලක් කපා හැරීම. |
| හානිකරණය(ගාස්තු)/ ආපසු හැරවූ | (64,208,945) | 1,278 | පෙර වර්ෂයේ හානිකරණයන් ආපසු හැරවීමක් සිදු වී ඇති අතර මූල්‍ය වත්කම් වල ක්‍රමක්ෂය පිරිවැය- ණය සහ අත්තිකාරම් හාණිකරණ ගාස්තුව රු. 57,399,184. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පෙර වසර සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දක්වා ඇත.

| විස්තරය | ආංශික අනුපාතය* (%) | සීමා සහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) 2020 (%) | 2019 (%) |
|---|---|---|---|
| ලාභදායිතා අනුපාත | | | |
| සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ අනුපාතය(ROE) | 16.7 | 4.8 | 8.68 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) | 1.3 | 4.62 | 7.09 |
| ශුද්ධ පොලී ආන්තිකය | 3.4 | 7.94 | 10.34 |

ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය- Tier I (අවම5 %) | **82.04** | **82.81** |
| වත්කම් ගුණාත්මක අනුපාත | | |
| දළ අක්‍රීය අත්තිකාරම් අනුපාතය | **20.73** | **82** |
| ද්‍රවශීලතාවය | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය | **511.32** | **514.15** |

* ආංශික අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුව විසින්ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු වලින් උපුටා ගන්නා ලදී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) බැංකුවේ නිසිශ්‍රමවිභජනයක් නොතිබුණි. උදා:මුල්‍ය අංශයේ කාර්යමණ්ඩලය දීර්ඝ කාලයක් තිස්සේ කුලීපිට ගැණුම් සහ කල්බදු කටයුතු සිදු කිරීම. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ව්‍යාපාර සැලැස්ම සමඟ ඒකාබද්ධ කිරීම අවසන් වන තෙක් මෙම කාල සීමාව තුළ අනවශ්‍ය වියදම් සීමා කිරීමේ අරමුණින් සීමිත කාර්ය මණ්ඩලයක් **(107)** යෙදවීමට බැංකුව ක්‍රියා කර ඇත.එබැවින්, ජොෂ්ඨයන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුට අනෙකුත් දෙපාර්තමේන්තු/ ව්‍යාපාරඒකක සමස්ථයක් ලෙස සලකා බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් තාවකාලිකව සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම පිණිස කටයුතු කිරීමට සිදු වී ඇත. | වංචනික ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා බැංකුව ශ්‍රමවිභජනය පවත්වා ගෙන යා යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**විගණන ගැටළුව**

(i) **2020** දෙසැම්බර් **31**දින වන විට මුළු හිඟ ණය ප්‍රමාණය රු.මිලියන **3,705** කි. එයින් රු. මිලියන **1,620** ක් හෙවත් සියයට **43.7** ක් අක්‍රීය ණය ලෙස වර්ග කර තිබුණි.පහත සඳහන් අක්‍රීය ණය **2021**සැප්තැම්බර් **30** දිනට ප්‍රදානය කරන ලද මුළු ණය මුදලින් සියයට **40** කට වඩා වැඩි ප්‍රතිශතයක් විය.

| නිෂ්පාදිතය අනුව පහසුකමේ නම | ප්‍රදානය කරන ලද මුළු මුදල | 31.12.2020දිනට | | 31.09.2021 | |
|---|---|---|---|---|---|
| | | මුළු හිඟ මුදල | අක්‍රීය% | මුළු හිඟ මුදල | අක්‍රීය |
| දොරින් දොරට | 15,654,792 | 8,719,517 | 70 | 6,081,746 | 72 |
| තනි පුද්ගල පරිභෝජන ණය(ICL) | 236,272,040 | 165,552,957 | 42 | 69,856,461 | 46 |

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

යොමු කරන ලද ණය ලබා දීම වසර කිහිපයකට පෙර නතර කරන ලද අතර දැනට අය කරනු ලබන්නේ නියමිත ණය පමණි.එම නිසා එක් එක් නිෂ්පාදන වල (ණය වර්ග වල) අක්‍රීය අනුපාතය වැඩි වී ඇත.**PSDB**ගණුදෙනුකරුවන්ගේ කළඹ පැවරීමත් සමඟ සියයට **100** ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර **2021** ජනවාරි **01** සිට **2021** නොවැම්බර් **30** දක්වා කාලය තුළ රු.මිලියන**11.87** ක් ඇතුළු රු.මිලියන **31.84** ක මුදලක් අයකර ගෙන ඇත.

**නිර්දේශය**

යෝග්‍ය අයකර ගැනීමේ පටිපාටියක් බැංකුව විසින්පවත්වා ගෙන යා යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන (MFD) | 17,033,870 | 11,609,440 | 100 | 11,609,440 | 100 |
| ප්‍රජා දිරිය | 60,440,000 | 22,268,507 | 92 | 20,435,358 | 95 |
| පුද්ගලයින්,දේපල,කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ ණය (REPPIA) | 60,075,000 | 53,171,764 | 100 | 53,171,764 | 100 |
| ස්වශක්ති | 9,600,000 | 4,576,399 | 86 | 3,946,518 | 91 |
| වාහන | 2,260,000 | 2,205,993 | 100 | 2,205,993 | 100 |
| ක්ෂුද්‍ර මූල්‍ය- ණය එකතුව | 1,790,961,743 | 839,813,694 | 40 | 333,565,569 | 49 |
| ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුව (PSDB) | අදාල නොවේ. | 998,605,882 | 100 | 998,605,882 | 100 |

රු.මිලියන1449.11අක්‍රීය ණය මුදලින් , රු.මිලියන 993.71 ක් ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුවට (PSDB) අයත්ය.ඒවා PSDB සමස්ථ ණය කළඹ පවරණ අවස්ථාවේදී අක්‍රිය ණය ලෙස පැවතුණි.ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විසින් ප්‍රදානය කර ඇති ණය වලින් ජනනය කරන ලද අක්‍රීය ණය රු.මිලියන 455.4 කි.තවද මහ බැංකුවේ වැළැක්වීමට අනුව බැංකුව 2021 ජනවාරි 05 සිට නව ණය ලබා දීම නවතා ඇති අතර ණය කළඹ රු.මිලියන 590.25 කින් අඩු වී ඇත.2020 දෙසැම්බර් 31 වැනි දිනට සාපේක්ෂව 2021 නොවැම්බර් 30 වන විට බැංකුව විසින් අක්‍රිය ණය පරිමාව රු.මිලියන 132 කින් අඩු කර ගැනීමය ණය කළඹ අඩු වීම ප්‍රධාන දායකත්වයක් විය.

(ii) පහත සඳහන් දින540 ක් ඉක්ම වූ හිඟඅක්‍රීය ණයප්‍රදානය කරන ලද මුළු ණය සමඟ සැසඳීමේ දී විශාල ප්‍රතිශතයක් විය.

| ණය වර්ගය | දින 540 ඉක්ම වූ හිඟ මුදල | හිඟ මුළු ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| | රු. | |
| දොරින් දොරට | 5,219,329 | 66 |
| ස්ව ශක්ති | 2,762,738 | 63 |
| වාහන | 1,562,832 | 100 |
| පුද්ගලයින් ,දේපල, කර්මාන්තපුනරුත්ථාපන අධිකාරියේ ණය(REPPIA) | 47,442,189 | 100 |
| ප්‍රජා දිරිය | 16,235,893 | 79 |
| ක්ෂුද්‍ර මූල්‍ය සංවර්ධන | 9,419,836 | 100 |
| ක්ෂුද්‍ර මූල්‍ය | 266,629,257 | 33 |

**දොරින්දොරට,ස්ව ශක්ති,වාහන,ප්‍රජා දිරිය,ක්ෂුද්‍ර මූල්‍ය සංවර්ධන ණය -**

බැංකුව මෙම ණය වර්ග අළුතින් ප්‍රදානය කිරීම නවතා දමා ඇති අතර අයකර ගැනීම්/ නඩුකටයුතුක්‍රියාත්මක වෙමින් පවතී.

**පුද්ගලයින් ,දේපල,කර්මාන්ත පුනුරුත්ථාපන අධිකාරියේ ණය (REPPIA)–**

රජයේ උපදෙස් මත LTTE සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීමට මෙම පහසුකම ලබා දී ඇත.මෙම තත්ත්වය යටතේ නැවත අය කර ගැනීම පසු විපරම් කරමින් පවතී.මෙම පහසුකම 2012-2013 කාලයේදී ප්‍රදානය කර ඇත.

යෝග්‍ය අයකර ගැනීමේ පටිපාටියක් බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.